





ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වත්නි,

අද පොසොන් පුර පසළොස්වක පොහොය දිනයයි. භාරතයේ පැවති තෙවන සංගීතියෙන් පසුව ධර්මාශෝක මහ රජතුමා රටවල් 9 කට ධර්මදූතයින් වහන්සේලා පිටත්කර හැරිය බව ඉතිහාසය කියයි. ධර්මාශෝක මහ රජතුමාගේම පුත් මිහිඳු මාහිමියන් ලංකාවට වැඩම කළේ විභජ්ජවාදයේ නියෝජිතයෙකු හැටියටයි. තුන්වන සංගීතියේදී ථේරවාදී සම්ප්‍රදායට පටහැනි පුද්ගලවාදීන් මර්දනය කිරීම සඳහා මොගගලීපුතතතිසස මහ රහතන් වහන්සේ යොදාගත් වචනය විභජ්ජවාදය (බෙදා දක්වන දහමක්) යන වචනයයි. එම විභජ්ජවාදය නියෝජනය කරමින් ශ්‍රී ලංකාවට වැඩම කළ මිහිඳු මා හිමියන් දේවානම් පියතිස්ස රජතුමා ඇතුළු සිරි ලක්වැසියන්ට චූල්ලහත්ථිපදෝපම සූත්‍රය දේශනා කොට ලක්දිව බුදු සසුන පිහිට වූයේ අද වැනි පොසොන් පුර පසළොස්වක පොහොය දිනයකය. ඒ නිසා අද වැනි උතුම් දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ මිහිඳු මාහිමියන් අපට හඳුන්වාදුන් සීලය පිළිබඳව අවබෝධයක් ලබා ගෙන දෙලොව ජය ගැනීමයි.

අද මෙම සදහම් පණිවිඩය සඳහා අප තෝරාගත්තේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයිති අපදාන පාලියෙහි එන රාහුල ථෙර අපදානයෙහි සඳහන් ගාථා ධර්මයකි. රාහුල හිමියන් බුදුන්වහන්සේ ඉදිරියේදී ප්‍රකාශ කරන්නේ කිරළ පක්ෂියා බිත්තර රකින්නාසේ, සෙමෙර මුවා වලිගය ආරක්ෂා කරන්නා සේ මම හොඳින් සිල් ආරක්ෂා කරන බවයි. ත්‍රිපිටක ධර්මයට අටුවා ලියන්නට මත්තෙන් බුද්ධඝෝෂ හිමියන් ලියූ විසුද්ධි මාර්ගයේ සීල නිර්දේශ කොටසේ ද මීටම සමාන ගාථාවක් එයි.

"කිකීව අණ්ඩං චමරීව වාලධිං - පියංව පුතතං නයනං ව එකකං

තථේව සීලං අනුරකඛ මානකා - සුපෙසලා හොථ සදා සගාරවා "

"කිරළ පක්ෂියා බිත්තර ආරක්ෂා කරන්නාක් මෙන් ද, සෙමෙර මුවා වලිගය ආරක්ෂා කරන්නාක් මෙන් ද, මව්පියෝ තම එකම පුතු ආරක්ෂා කරන්නාක් මෙන් ද, එක් ඇසක් ඇති කෙනෙකු එම ඇස ආරක්ෂා කරන්නා සේ ද, බුද්ධාදී උතුමන් කෙරෙහි ගෞරවයෙන් යුක්තව ප්‍රියශීලීව ජීවත් වන්න. "

මිහිඳු මාහිමියන් අද වැනි දිනක අපට හඳුන්වාදුන් සීලය ආරක්ෂා කළ යුත්තේ කෙසේද යන්න අපදාන පාලියෙහි එන රාහුලථෙර අපදානයෙනුත් විසුද්ධි මාර්ගයේ සීල නිර්දේශයේ එන ඉහත ගාථා වෙනුත් මැනවින් පැහැදිලි වෙයි. කිරළ පක්ෂියා බිත්තර ආරක්ෂා කරන්නේ කකුල් දෙක උඩට හරවා ගෙනයි. ඊට හේතුව අහස කඩා වැටේය යන බිය නිසාය. එයින් කිරළා තම දරුවන්ට ඇති ආදරය සිතා ගත හැකිය. සෙමෙර මුවාට ඉතා සිහිඳු කෙඳිවලින් යුක්ත වලිගයක් ඇත. එම වලිගයේ එක කෙන්දක් හෝ කටු අත්තක පටලැවිනොත් ඌ එතනම නොකා නොබී මිය යයි. එම කෙන්ද කඩා ගෙන නොයයි. සෙමෙර මුවා තම වලිගයට ඇති ආදරය එයින් සිතාගත හැකිය. තමාට සිටින්නේ එකම පුතෙක් නම් එම දෙමාපියන් ඔහු ආරක්ෂා කරන්නේ තම පණ මෙන් එක් ඇසක් අහිමි වූ පුද්ගලයා තමාගේ ඉතිරි එකම ඇස ආරක්ෂා කරන්නේ ඉතා ප්‍රවේශමෙනි. මේ උපමා හතරම දක්වා අපට කියා දෙන්නේ සීලයද එසේ ආරක්ෂා කළ යුතු බවයි. අද දින විහාරස්ථානවල සිල් සමාදන්ව සිටින උපාසක උපාසිකාවන් ද, කුඩා දරුවන් ද එම පින්වතුන්ට ආගමික වශයෙන් සංග්‍රහකර භික්ෂූන් වහන්සේලාවන අපිද මේ කාරණය හොඳින් සිත තබාගෙන ක්‍රියා කළහොත් අපට දෙලොව ජය ගත හැකිය. අද වැනි දිනක මිහිඳු මාහිමියන්ට ගෞරව සැලකිලි දක්වන හැම දෙනාම එම කාරණය සිත්හි තබාගත යුතුයි.

ඉහත සඳහන් කළ ආකාරයට සීලය ආරක්ෂාකළ එකොළොස් දෙනෙක් ගැන ජාතක පොතේ කුරුධර්ම ජාතකයේ සඳහන් වේ. (257 ජාතකය) බුදුන්වහන්සේ ජීවත් වූ කාලයේ භික්ෂූන් වහන්සේලා 2 නමක් අචිරවතී ගඟෙහි නා අව්වට වී සිටිමින් ආගිය තොරතුරු කථා කළහ. ඈත අහසෙහි හංසයින් දෙදෙනෙක් පියාසර කරනු දැක වයසින් අඩු භික්ෂුව අනෙක් භික්ෂුවට කීවේ මම අර හංසයාගේ ඇසට ගලකින් විදින බවයි. එය කළ නොහැක්කක් බව අනෙක් භික්ෂුව කීවිට වයසින් අඩු භික්ෂුව කීවේ මම එම හංසයාගේ මේ පැත්තේ ඇසට නොව අනෙක් පැත්තේ ඇසට විදිනා බවයි. මෙසේ කී එම භික්ෂුව ගල් කැටයක් ගෙන හංසයා දෙසට විද්දේය. එම ගල එන ශබ්දය නිසා හංසයා ඔලුව හැරවිය. ඒ මොහොතේම තවත් ගලක් ගෙන හංසයාගේ ඇසට ඉලක්ක කොට විද්දේ ය. එම ගල ඒ ඇසට වැදී අනෙක් ඇසෙන් පිටවිය. හංසයා මැරී බිම වැටුනේය. මේ බව ආරංචි වූ විට බුදුන්වහන්සේ එම භික්ෂුව ගෙන්වා කාරණය සැබෑදැයි විමසා ඒ භික්ෂුව නොමනා කටයුත්තක් කළා යයි අවවාද අනුශාසනා කළ සේක. මේ කුරු ධර්ම ජාතකයේ වර්තමාන කථාවයි.

මෙහිදී බුදුන්වහන්සේ දේශනා කරන්නේ අබුදෙධෝත්පාද කාලවල පවා ගිහියන් හොඳින් පංචසීලය ආරක්‍ෂා කොට දෙලොව ජයගත් බවයි. ඒ කාරණය පැහැදිලිකර දෙන්නේ කුරු ධර්ම ජාතකයෙනි. අතීතයේ කුරු රට ඉඳිපත් නුවර ධනඤ්ජය රජුට පුත්ව උපන් අප මහා බෝසතාණෝ ධාර්මිකව රාජ්‍යය කරගෙන ගියහ. ඒ නිසා එම රට සියලු අතින් සශ්‍රීක විය. එම රටට ආසන්නයේ තිබූ කලිඟු රටට වර්ෂාව නැත. ඒ නිසා දුර්භික්‍ෂ , රෝග, අමනුෂ්‍ය යන ත්‍රිවිධ බියක් ඇතිවුනා. ජනතාව රජු ඉදිරියට ගොස් උද්ඝෝෂණය කළහ. මා කළ යුත්තේ කුමක්දැයි ඇසුවිට ජනතාව කීවේ පන්සිල් රකිමින් දන් දෙමින් උපවාස කළ යුතු බවයි. එසේ කළත් වැස්ස නැත. ඊළඟට මිනිසුන් කීවේ කුරු රට ඉඳිපත් නුවර ධනඤ්ජය රජුගේ පින්වත් ඇතා මේ රටට ගෙන්වා ගතහොත් වර්ෂාව ලබාගත හැකි බවයි. බමුණන්ගේ මාර්ගයෙන් ඇතාද ගෙන්වා ගත් නමුත් වැසි නැත. ඊළඟට මිනිසුන් කීවේ ඉඳිපත් නුවර රජතුමා ළඟ කුරු ධර්මය නම් වූ පංචසීල ප්‍රතිපත්තියක් ඇත. එය රන්පතක ලියවාගෙන අප රටට ගෙන්වා ගත හොත් වැසි ලබාගත හැකි බවයි.

කලිඟු රටේ රජතුමා බමුණන් යවා කුරුධර්මය ගෙන්වා ගැනීමට කටයුතු සංවිධානය කළහ. එහිදී රජතුමා, රජුගේ මෑණියන්, රජ බිසව, යුවරජු, පුරෝහිත, භාණ්ඩාගාරික ඇමති, රථාචාර්ය, සිටාණන්, තක්සේරු ඇමති, දොරටුපාල, නගරසෝභිනී යන එකොළොස් දෙනා වෙතට ගොස් කුරු ධර්මය ඉල්වීය. ඔවුන් තමා රකිනා කුරු ධර්මය රන් පත්වල ලියා දෙන්නේ සැකයෙනි. තමා තුළ පවත්නා ඉතාම සුළු අඩුපාඩුවක් නිසා තමා රකිනා පංචසීලය කැඩී ඇතැයි ඔවුන්තුළ සැකයක් පවතී. එම එකොළොස් දෙනා කියන කථා දෙස බලන විට පෙනී යන්නේ සීලය ආරක්‍ෂා කළ යුත්තේ කෙසේද කියායි.

කලිඟු රටේ දූත පිරිස කුරු ධර්මය ලබා ගැනීම සඳහා මුලින්ම යන්නේ කුරු රටේ ඉඳිපත් නුවර රජු වෙතය. රජුගෙන් කුරු ධර්මය ඉල්ලූ විට රජතුමා කියන්නේ දරුවෙනි, මම පන්සිල් හොඳින් ආරක්‍ෂා කරමි. නමුත් මට දැන් ඒ ගැන සැකයක් ඇතිවී තිබේ. දිනක් මම උත්සවයකට ගියෙමි. එහිදී ඊතල 04 ක් අහසට විදීමි. එයින් තුනක්ම පොළොව උඩට වැටෙනු දුටුවෙමි. එකක් ගඟකට වැටුණි. ඒ ඊතලය වැදී කිසියම් සතෙකු මැරෙන්නට ඇතැයි මට සැකයක් පවතී. එසේ වූයේ නම් මගේ පන්සිල් බිඳී ගොස්ය. ඒ නිසා කුරු ධර්මය දීමට නොහැකි යයි කීහ. පිරිස කියා සිටියේ ඔබතුමා සිතා මතා කළ දෙයක් නොවන නිසා ඔබේ සීලයට බාධාවක් නැත. මෙසේ කියා රජතුමාගේ කුරු ධර්මය ඉල්ලාගත්හ. රජතුමා එහිදී ඔවුන්ට කුරු ධර්මය දී කියන්නේ මගේ මෑණියන් වහන්සේ ඉතා හොඳින් කුරු ධර්මය රක්නා නිසා එතුමියගෙන්ද ඉල්වා ගන්නා ලෙසයි.

කලිඟු දූත පිරිස රජුගේ මෑණියන් වෙත ගිය පසු ඇයද කියන්නේ තමා පන්සිල් ආරක්‍ෂා කළත් ඒ ගැන සැකයක් පවත්නා බවයි. මට පුතුන් දෙදෙනෙක් සිටී. රජතුමාගෙන් මට ලැබුණු ලක්‍ෂයක් වටිනා සඳුන් කැටය මගේ පොඩිපුතාගේ ස්වාමි දියණියට දුනිමි. ලොකු පුතාගේ ස්වාමි දියණියට දුන්නේ දාහක් වටිනා රන්මාලයකි. වැඩිහිටි කම ගැන නොසලකා කළ මේ ක්‍රියාව මම කළ අකටයුත්තක් ලෙස දකිමි. ඒ නිසා මාගේ පංචසීලය පලුදුවී ඇතැයි සිතමි. දූත පිරිස කියා සිටියේ නොදැනුවත්ව සිදුවූ එම ක්‍රියාවෙන් සීලය බිඳීමට නොහැකි බවයි. රජුගේ මෑණියන් කුරු ධර්මය ලියා දූත පිරිසට දෙන ගමනේ මෙසේ කීවාය. මගේ පුතාගේ බිසව ඉතා හොඳින් පන්සිල් රකී, ඇය ලඟටද ගොස් කුරු ධර්මය ලියාගන්නයයි කීහ.

රජ බිසව ළඟට ගොස් කුරු ධර්මය ඉල්ලූ විට ඇය කියා සිටියේ මා ඉතා හොඳින්පන්සිල් ආරක්‍ෂා කළත් දැන් සැකයක් ඇති බවයි. තමා සී මැදුරු කවුළුව ළඟ සිටිනා විට රජතුමා ඇතා පිට යයි. රජුගේ පිටුපස යුවරජු සිටී, ඔහු දුටුවිට මට ඔහු ගැන පිළිබඳ සිතක් ඇති වුනා. තම විවාහක ස්වාමියා සිටියදී වෙනත් පුරෂයෙකු ගැන සිතීම නොවටී. ඒ නිසා මාගේ සීලය බිඳී ඇතැයි කීහ. එවිට දූත පිරිස කියා සිටියේ සිතින් යමක් සිතූ පමණින් සීලය

නොබිඳෙන බවයි. බිසව ඔවුන්ට කුරු ධර්මය ලියා දෙන ගමනේ කියා සිටියේ යුවරජතුමා ඉතා හොඳින් කුරු ධර්මය රකිනා බැවින් ඔහු ළඟටද යා යුතු බවයි.

යුවරජුගෙන් කුරු ධර්මය ඉල්ලූ විට ඔහුද කියන්නේ තම සීලය ගැන සැකයක් ඇතිවී තිබෙන බවයි. දිනක් සවස මගේ ආරක්ෂක පිරිස සමග අශ්වයින් සමග රජ ගෙදරට ගියෙමි. රාජකීය කටයුතු වැඩි වූ නිසා රජගෙදරින් ඒමට සිදු වූයේ උදේ පාන්දරය. උදේ රජ මිදුලට ඇවිත් බලන විට රාත්‍රී මහ වැස්සක් වැටී සියලු දෙනාම තෙමී ඇත. මා එනතුරු බලා සිට ඒ සියලු දෙනාටම මගෙන් සිදුවූ අකටයුත්ත ගැන සිතෙන විට මාගේ කුරුධර්මය පලුදු වී ඇතැයි යුවරජු කීහ. සිතාමතා නොකළ ක්‍රියාවක් නිසා එසේ නොවන බව පැවසූ දූත පිරිස යුවරජුගෙන්ද කුරු ධර්මය ලියවා ගත්හ. එම කුරු ධර්මය දෙන යුවරජු කියා සිටියේ රජුගේ පුරෝහිත තුමා හොඳින් පන්සිල් රකිනා බැවින් ඔහු ළඟට ද යා යුතු බවයි.

පුරෝහිත තුමාගෙන් කුරු ධර්මය ඉල්ලූවිට ඔහුද කියා සිටියේ තම සීලය ගැන සැකයක් පවතින බවයි. දිනක් තමා රජගෙදරට යනවිට රජතුමාට ඉතා වටිනා රථයක් ලැබී තිබිණි. එය දුටු මට සිතුනේ මේ රථය මට ඇත්තනම් හොඳයි කියායි. රජතුමාද මේ රථය පුරෝහිතට දෙමියි කියා දුන්නත් මම එය භාර නොගතිමි. නමුත් අනුන් සන්තක දෙයක් මා සන්තක වේවායි කියා සිතීමම වරදකි. ඒ නිසා මගේ කුරු ධර්මය පලුදුවී ඇතැයි සිතමි. දූත පිරිස කියා සිටියේ සිතූ පමණින් සීලය නොබිඳෙන බවයි. පුරෝහිත ඔවුන්ට කුරු ධර්මය ලියා දෙන ගමනේ කියා සිටියේ අපේ භාණ්ඩාගාරික ඇමති හොඳින් කුරු ධර්මය රකිනා නිසා ඔහු වෙත යා යුතු බවයි.

භාණ්ඩාගාරික ඇමති වෙත ගිය පසු ඔහු කියන්නේ තම සීලය ගැන සැකයක් පවතින බවයි. රජුගේ කුඹුරක් මනිද්දී ලණු කොන හරියටම ආවේ කකුළු බිලක් උඩටයි. ඉන් එහාට ගතහොත් රජුට වැඩිවෙයි. මෙහාට ගතහොත් රජුට අඩුවෙයි. ඒ නිසා ලණු කොණ තිබූ තැන ලීයක් සිටවූයෙමි. ලීය සිටුවන විට ක්‍රීං යනුවෙන් හඬක් ඇසුණි. එම ලී කොන වැදී කකුළුවෙකු මිය ගියායයි මට සැකයක් පවතී. දූත පිරිස කියා සිටියේ නොසිතා කළ ක්‍රියාවක් නිසා ශීලය නොබිඳෙන බවයි. භාණ්ඩාගාරිකතුමා ඔවුන්ට කුරු ධර්මය ලියා දෙන ගමනේ කියා සිටියේ අපේ රථාචාර්යයා හොඳින් කුරු ධර්මය රකිනා බැවින් ඔහුවෙත යා යුතු බවයි.

රථාචාර්යයාගෙන් කුරු ධර්මය ඉල්ලූ විට ඔහුද කියන්නේ තමා හොඳින් පන්සිල් ආරක්ෂා කළත් ඒ ගැන දැනට සැකයක් ඇති බවයි. දිනක් රජු සමග අසු පිටින් යන විට මහ වැස්සක් ඇද හැලුණි. රජතුමා ඉක්මනින් රජ ගෙදරට පැමිණ විය යුතු නිසා අශ්වයාට තදින් පහර දුනිමි. දැන් එම ස්ථානයෙන් අශ්වයා යන හැම අවස්ථාවකම වේගයෙන් දුවන්නට පුරුදු වී සිටී. ඒ නිසා මම අශ්වයාට කළ අකටයුත්ත නිසා මාගේ සීලය බිඳී ඇතැයි කීහ. දූත පිරිස කියා සිටියේ එවැනි අකටයුත්තකින් සීලය නොබිඳෙන බවයි. රථාචාර්යයාද, කුරු ධර්මය ඔවුන්ට ලියා දී කියා සිටියේ සිටාණන් වෙත යා යුතු බවයි.

සිටාණෝද කියන්නේ තම සීලය ගැන සැකයක් ඇති බවයි. දිනක් ඇල් කෙතක් ළඟින් යන විට එම ඇල් කරල් මිටියක් කඩා මාලයක් කර පැලදීමි. එම ඇල්කෙත රජුට සහ මට අයිති එකකි. එසේ උවත් මම හොරකමක් කළායයි මට සිතේ. එසේ නොවන බව දූත පිරිස කීවිට ඔවුන්ට කුරු ධර්මයදී කියන්නේ අපේ තක්සේරු ඇමති වෙත ගොස් කුරු ධර්මය ඉල්ලා ගන්නා ලෙසයි.

තක්සේරු ඇමති කියන්නේ දිනක් වී මනින විට වර්ෂාවක් පැමිණි නිසා ඉක්මනින් වී ටික අකුලා ගෙට ගතිමි. එවිට මැනපු වී නොමැනපු වී සමග මිශ්‍ර වන්නට ඇතැයි සිතේ. එය අකටයුත්තකි. එවිට දූත පිරිස කියන්නේ සිතා

මතා නොකළ දෙයක් නිසා සිල් නොබිඳෙන බවයි. ඔවුන්ට කුරු ධර්මය දෙන තක්සේරු ඇමති කියන්නේ දොරටුපාලයා වෙත යා යුතු බවයි.

දොරටුපාලයාද කියන්නේ තම සීලය ගැන සැකයක් පවතින බවයි. දිනක් නුවර දොර වැසූ පසු කවුදෝ දොරට ගසයි. දොරටුව හැර බැලූ විට පුරුෂයෙක් කාන්තාවක් සමග සිටී. මම ඔවුන් දෙදෙනාට ඉතා නරක විදියට දොස් කීමි. එවිට ඔහු කීවේ මේ මාගේ බිරිඳ නොව නංගී කියායි. එහිදී මට මහත් වේදනාවක් ඇතිවිය. එහිදී සිතා මතා නොකළ නිසා සීලය නොබිඳේ යයි කීවිට දොරටු පාලයා ඔවුන්ට කුරු ධර්මය ලියාදී රටේ ජීවත්න නගර ශෝභිනිය වෙත යන ලෙස කියයි.

නගර ශෝභිනියද කීවේ තම සීලය ගැන සැක ඇති බවයි. දිනක් පුරුෂයෙක් මට මසු 1000 දී ගියා. නමුත් අවු 3 යනතුරුම ඔහු ආවේ නැත. එතෙක් මම කිසිවෙකුගෙන් මුදල් නොගතිමි. මට දැන් ජීවත්වීමට නොහැකි නිසා එම මුදල රජුටදී නිදහස් උනෙමි. එදිනට මම වෙන කෙනෙකුගෙන් මුදල් ගන්නට සූදානම් වන විටම අර පැරණි පුරුෂයා එතනට පැමිණියා. ඔහු දුටුවිටම මම ඒ මුදල් නැවත දුනිමි. මේ පැමිණ තිබුණේ ශක්‍ර දේවේන්ද්‍රයායි. වෛශ්‍යයා දුවගේ සීලය පරීක්ෂා කිරීම සඳහා ඔහු අවු 3 කට උඩදී කහවනු දාහක් දී තිබුණි. එහිදී දූත පිරිස කියා සිටියේ ඔබ නොමනා රැකියාවක් කළත් එය සාධාරණව කළ නිසා සීලය නොබිඳී ඇති බවයි. ඇයද ඔවුන්ට කුරු ධර්මය ලියා දුන්නාය.

මිහිඳු මා හිමියන් අද වැනි දිනක අපට හඳුන්වා දුන් සීලය කෙසේ ආරක්ෂා කළ යුතු ද යන්න මෙයින් පැහැදිලි වේ. නූතනයේ බොහෝ දෙනා පන්සිල් තුට්ටුවකටවත් ගරු කරන්නෙ නැත. ඒ නිසා සිදුවී ඇත්තේ කුමක්ද?, කලට වැසි නොවසී. පරිසරයම අපට ද්වේෂ කරන තත්වය පත්වී තිබේ. ඇසු ඇසූ තැන විෂබීජය. මේ නිසා අපදානපාලියේ රාහුල හිමියන්ද විසුද්ධි මාර්ගයේදි බුද්ධ ඝෝෂ හිමියන්ද පැවසූ ආකාරයෙන් සීලය ආරක්ෂා කොට ගෙන දෙලොව ජය ගැනීමට අදිටන් කර ගනිමු.